ස/අධි/17/දැයට කිරුළ

2013.08.

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
සහකාර සමෘද්ධි කොමසාරිස්/දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ ,
ප්‍රාදේශීය ලේකම්/ප්‍රාදේශීය සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සමෘද්ධි සම්බන්ධීකරණ නිළධාරි,
සමෘද්ධි කළමණාකරුවන් / සමෘද්ධි සංවර්ධන නිලධාරින්,
කුරුණෑගල / පුත්තලම / කෑගල්ල දිස්ත්‍රික්කය.

<u>දැයට කිරුළ **2014 -** ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව</u>
<u>**"ඉසුරුමත් නිවහනක්" සමාජ හා ජීවනෝපාය සංවර්ධන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම.**</u>

2013 අයවැය ලේඛණය මගින් ඉදිරිපත් කළ යෝජනාව අනුව 2015 දී දිළිදුකමින් තොර ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ ප්‍රධාන වගකීම ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ නිලධාරින් වෙත පැවරී ඇත. ඒ අනුව ක්‍රියාත්මක දැයට කිරුළ වැඩසටහනට සමගාමීව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් මත වැඩසටහන් රැසක් දිවයින පුරා ක්‍රියාත්මක කර ඇත.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ප්‍රාදේශීය සංවර්ධන) ගේ MED/S/S/1/DeyataKirula / 2014 හා 2013.07.26 දිනැති ලිපියට අනුව උක්ත වැඩසටහන යටතේ මාගේ සමාංක ස/අධි/17/දැයට කිරුළ හා 2013.06.28 දිනැති දැයට කිරුළ පොදු උපදෙස්වලට වැඩිමනත් වශයෙන් පහත සඳහන් තොරතුරු ඔබගේ අවධානයට හා ඉදිරි කටයුතු සඳහා යොදා ගන්නා මෙන් කාරුණිකව දන්වමි. මේ සඳහා 2013.07.18 දිනැති අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බවද සඳහන් කරමි.

02. එහිදී හදුනාගත් නිවාසලාභීන් සඳහා මුදල් වෙන් කිරීම් පහත පරිදි සංශෝධනය විය යුතු වේ.

i අදියර - වහලය සැකිල්ල උළු සෙවිලි කිරිමට සුදුසු පරිදි සවිමත්ව සකසා ඇති එහෙත් තාවකාලික සෙවිලි ඇති නිවාස සඳහා උළු සැපයීමට **(උපරිමය රුපියල් 30,000/- දක්වා.)**

ii අදියර - උළු සෙවිලි කිරීමට සුදුසු පරිදි වහලේ සැකිල්ල සැකසීමට අවශ්‍ය නිවාසවලට එම කාර්යයන් දෙක සඳහා **(උපරිමය රුපියල් 50,000/- දක්වා)**

iii අදියර - සවිමත් බිත්ති නොමැති වහලයේ සැකිල්ල නොමැති තාවකාලික සෙවිලි ඇති නිවාස සඳහා **(උපරිමය රුපියල් 65,000/- දක්වා)**

Iv අදියර - හඳුනා ගත් නිවාසවල ඉදිරිපස කෙටි වහලයක් සහිත පිලක් සකස් කිරීම සඳහා **(උපරිමය රුපියල් 10,000 දක්වා)**

V අදියර -වැසිකිළි පහසුකම් නොමැති නිවාස සඳහා වැසිකිළි පහසුකම් ලබාදීම ( උපරිමය රු. 15,000/- දක්වා)

03. මේවන විට ඔබ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලද ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තු දත්ත සමීක්ෂණයන් හා වෙනත් යෝජනා අනුව ඉහත පෙළ ගස්වා ඇති අදියරයන් සඳහා ප්‍රතිපාදන නිකුත් කිරීමේදී එම ප්‍රතිලාභීන් පහත නිර්ණායකයන් සපුරා තිබිය යුතු වේ.

I. ආධාර ලබාදීමට නියමිත නිවසේ හෝ ඉඩමේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

II. ආධාර ලබාදෙන නිවස අයත් ඉඩමේ අනවසර පදිංචිකරුවන් වන්නේ නම් එයනීත්‍යානුකූල කිරීම කළ හැකි විය යුතු බවට ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කළ යුතුය.

III. තාවකාලික නිවාස වේ නම් ඒවා උළු සෙවිලි කළ හැකි මට්ටමට සැකසිය යුතුය.

IV. නිවාස ආධාර ලබාදෙන නිවසට අමතරව වෙනත් නිවාසයක හිමිකරුවකු නොවිය යුතුය.

V. ඉහත අඩුපාඩු සපුරා ගැනීම සඳහා රජයේ වෙනත් නිවාස සංවර්ධන යෝජනා ක්‍රමවලින් ආධාර ලබා නොගෙන තිබිය යුතුය.

VI. අඩු ආදායම්ලාභීන් හා සමෘද්ධිලාභීන් සඳහා ප්‍රමුඛතාව ලබාදෙනු ඇත.

04. ඉහත නිර්ණායකයන්ට අනුකූලව මෙහි සඳහන් අදියරයන් යටතේ තෝරා ගත් ප්‍රතිලාභීන්ගේ නිවැරදි සාරාංශ වාර්තාව හා නිවැරදි නාම ලේඛණය ලිපිනය සහිතව හැකි ඉක්මණින් සකසා සමෘද්ධි අධිකාරියේ සමාජ සංවර්ධන අංශය වෙත එවිය යුතු වේ. තවදුරටත් පැවැත් වෙන ජංගම සේවා හා වෙනත් ඉල්ලීම් පිළිබඳ පරීක්ෂා කර බලා ඉදිරිපත් කිරීමටද පියවර ගත යුතුය. ඒ අනුව සති දෙකකට වරක් අළුතින් එකතු වන හා සංශෝධනය වන ප්‍රමාණයන් සහ විස්තර ලබාදිය යුතු අතර, නිම කළ හා වැය කළ නිවාස පිළිබඳ විස්තරද ලබාදිය යුතුය.

05. ඉන් අනතුරුව ඒ සඳහා අවශ්‍ය කරන ප්‍රතිපාදන අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇති පරිදි භාණ්ඩාගාරය විසින් සමෘද්ධි අධිකාරියට ලබාදීමෙන් අනතුරුව දිස්ත්‍රික් කාර්යාලය මගින් සමෘද්ධි බැංකු සංගම් වෙත ලබාදෙනු ඇත.

06. ප්‍රථමයෙන්ම බැංකු සංගම් බල ප්‍රදේශයට අයත් 1 අදියර යටතේ තෝරා ගත් ප්‍රතිලාභීන් සඳහා උළු ලබාදිම හා සෙවිලි කිරීම ක්‍රියාත්මක කලයුතුය. උළු ලබාදිම බැංකු සංගමය කළමණාකරු/ කළාප සහකාර හා වසම් භාර සංවර්ධන නිළධාරින් ඇතුළු ග්‍රාමීය කණ්ඩායම මගින් ක්‍රියාත්මක කළ යුතුය. මහා සංගම් කළමණාකාර අධ්‍යාක්ෂවරුන්, මුලස්ථාන කළමණාකරුවන්, ව්‍යාපෘති කළමණාකරුවන් හා සමාජ සංවර්ධන සහකාරවරුන් ඒ සඳහා අවශ්‍ය සහාය විම් සිදු කළ යුතුය.

6.1 තෝරා ගත් ප්‍රතිලාභීන් වෙත හෝ කලාප කාර්යාල වෙත අවශ්‍යතාව මත අදාළ උළු නිපදවන සංගමය හෝ උළු කර්මාන්ත ශාලාවෙන් සාමාන්‍ය උළු හා මුදුන් උළු ගෙනවිත් බාර දිම සිදු කරනු ඇත. එම උළු කැට 1000 හා මුදුන් උළු වෙනුවෙන් රු.30,000/- ක උපරිමයකට යටත්ව මුදල් ලබාදිය හැකිය. උළු ලබාදීමේදී උළු නිපදවන්නන්ගේ සංගමය ප්‍රතිලාභීන් වෙත පළමු පන්තියේ ( No: 01 ) උළු ලබාදීමට එකග වී ඇති අතර උළු ඇණවුම් කළයුතු උළු නිපදවන්නන්ගේ සංගම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

- සමස්ත ලංකා උළු නිෂ්පාදකයින්ගේ සංගමය
- සී/ස ලංකා උළු නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතිය.
- සමස්ත ලංකා මැටි සෙවිලි උළු නිෂ්පාදකයින්ගේ සංගමය.

ඒ ඒ දිස්ත්‍රික්කවලට උළු ලබා දීමට එම සංගම් එකගවී ඇති මිල පහත දක්වා ඇත.

| දිස්ත්‍රික්කය | සාමාන්‍ය උළුරු. | මුදුන් උළු රු. |
|---|---|---|
| පුත්තලම | 30/- - 32/- | 40/- - 42/- |
| කෑගල්ල | 32/- | 42/- |
| කුරුණෑගල | 32/- | 42/- |

- පුත්තලම දිස්ත්‍රික්කයේ දංකොටුව, වෙන්නප්පුව, නාත්තන්ඩියහා මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සදහා සාමාන්‍ය උළු කැටයක් රු. 30/- බැගින්ද මුදුන් උළු කැටයක් රු. 40/- බැගින්ද ලබාදීමට එකගවී ඇත.

එසේ ලැබෙන උළු බැංකු සංගමයේ කලමණාකරු හා වසම් භාර සංවර්ධන නිළධාරින් විසින් පරීක්ෂා කර බලා නියමිත ප්‍රමිතියට අනුකූල බවට සෑහීමකට පත් විය යුතුය. ඒ අනුව අදාළ ප්‍රතිලාභියා වෙත ලැබී ඇති උළු පිලිබඳව ඔහු සෑහීමකට පත් වන්නේ නම් දැයට කිරුළ ආකෘති පත්‍ර අංක 01 සම්පූර්ණ කර ප්‍රතිලාභියා ලවා අත්සන් කරවා ගත යුතු අතර වසම් භාර සමෘද්ධි නිළධාරි/ බැංකු කලාප සහකාර හා බැංකු කළමණාකරු එය සහතික කිරීම හා නිර්දේශ කිරීම කළ යුතුය. ( පිටපත් 03 කින් සම්පූර්ණ කළ යුතුය.)

එසේ සම්පූර්ණ කර ගන්නා ලද දැයට කිරුළ ආකෘති පත්‍ර අංක 01 අනුසාරයෙන් බැංකු සංගම් කලාපයට අදාල දැයට කිරුළ ආකෘති පත්‍ර අංක 03, 03(අ) සම්පූර්ණ කර වසමේ සමෘද්ධි නිළධාරියා හා කලාප බැංකු කලමණාකරු විසින් සහතික කර දැයට කිරුළ ආකෘති පත්‍ර 01 මුල් පිටපත සමඟ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මහා සංගමය වෙත යැවිය යුතුය. සමෘද්ධි මහා සංගමයේ දී සමාජ සංවර්ධන සහකාර හා ව්‍යාපෘති කළමණාකරු විසින් දැයට කිරුළ ආකෘති පත්‍ර අංක 04 සම්පූර්ණ කිරිම. දැයට කිරුළ ආකෘති පත්‍ර අංක 03, 03 (අ) හි සඳහන් තොරතුරු ඇසුරින් සකස් කර මහා සංගම් කළමණාකාර අධ්‍යක්ෂ සහතික කර හා ප්‍රාදේශීය ලේකම් අනුමැතිය සහිතව දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය.

( දැයට කිරුළ ආකෘති පත්‍ර 01 සමඟ යැවිය යුතුය.) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී දැයට කිරුළ ආකෘති පත්‍ර අංක 03, 03 (අ) අනුසාරයෙන් දැයට කිරුළ ආකෘති පත්‍ර අංක 04 සකස් කර මුලස්ථාන කළමණාකරු / කළමණාකාර අධ්‍යක්ෂ නිර්දේශ කර ප්‍රාදේශීය ලේකම් / ප්‍රාදේශීය සමෘද්ධි අධ්‍යක්ෂ අනුමැතියෙන් දිස්ත්‍රික් කාර්යාලයට යැවිය යුතුය. එහිදී දැයට කිරුළ ආකෘති පත්‍ර අංක 04 අනුසාරයෙන් දැයට කිරුළ ආකෘති පත්‍ර අංක 05 සකස් කර සහකාර සමෘද්ධි කොමසාරිස්/දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිළධාරිගේ නිර්දේශය සහිතව දිස්ත්‍රික් ලේකම් අනුමැතිය සහිතව ඉදිරිපත් කර අවශ්‍ය අග්‍රිම මුදල් ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත යුතුය.

**ගෙවීම් සිදු කරන ආකාරය**

තෝරා ගත් ප්‍රතිලාභින් වෙත සමෘද්ධි බැංකු සංගම් කළමණාකරුගේ හා කලාප සහකාරගේ මඟ පෙන්වීම් යටතේ අවශ්‍ය උළු ප්‍රමාණය උළු නිෂ්පාදකයින්ගේ සමිතිය / උළු කර්මාන්ත ශාලාව ගෙනවිත් බාර දුන් පසු අදාළ දැයට කිරුළ ආකෘති පත්‍ර අංක 01 සම්පූර්ණ කළ යුතුය. ඉන් පසුව ලබා ගත් උළු සඳහා ගෙවිය යුතු මුදල නිදහස් කිරිමට අවශ්‍ය දැයට කිරුළ ආකෘති පත්‍ර 03, 03(අ) සම්පූර්ණ කර ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. එම අනුමැතිය මත සමෘද්ධි බැංකු සංගමය මගින් අදාළ ප්‍රතිලාභින්ගේ බැංකු ගිණුම්වලට එම මුදල් ගිණුම් ගත කළ යුතුය.එක් එක් බැංකු සංගම් විසින් සකස් කර ඉදිරිපත් කර ඇති දැයට කිරුළ ආකෘති පත්‍ර අංක 03, 03(අ) හා 04 පරිදි ලැබෙන චෙක්පත් දිස්ත්‍රික් ලේකම් /දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ ගිණුමට එකතු කර පොදු තැන්පත් ගිණුම මගින් අදාළ උළු නිෂ්පාදන සමාගම/ නිෂ්පාදකයින්ගේ සංගමය වෙත චෙක්පත් මගින් ගෙවීම් දිස්ත්‍රික් කාර්යාලය මගින් සිදු කළ යුතුය. ඒ පිළිබඳ බැංකු සංගම් මට්ටමේදී ගිණුම් තබන ආකාරය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ❖ ජංගම ගිණුම | හර | |
| උළු සඳහා ලද මුදල් ගිණුම | | බැර |
| ❖ උළු සඳහා ලද අරමුදල් ගිණුම | හර | |
| .................. තැන්පත් ගිණුම් | | බැර |
| ❖ .................. තැන්පත් ගිණුම් | හර | |
| උළු සඳහා දිස්ත්‍රික් ලේකම් වෙත යැවිය යුතු මුදල් ගිණුම | | බැර |
| ❖ උළු සඳහා දිස්ත්‍රික් ලේකම් වෙත යැවිය යුතු මුදල් ගිණුම | හර | |
| ජංගම ගිණුම | | බැර |

සටහන : උළු ප්‍රතිලාභීන් වෙනුවෙන් වෙනම ලේඛණයක් මුදල් ගෙවීම් සහ ලැබීම් පිළිබඳව නඩත්තු කළ යුතුය.

6.2. ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව විසින් සිදු කළ සමීක්ෂණයේ තොරතුරු මත සමෘද්ධි අධිකාරියේ නිලධාරින් විසින් සිදු කරන ලද සමීක්ෂණයේ දත්ත පදනම් කර ගෙන පළමු අදියර යටතේ ප්‍රතිලාභීන් වෙත උළු ලබාදීම සිදු කරනු ඇත. එසේ ලබාදෙන උළු (සාමාන්‍ය උළු හා මුදුන් උළු ) සඳහා ගෙවීම් කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියෙන් ලබාදෙන ප්‍රතිපාදන හා අග්‍රිම මුදල් කිසියම් හේතුවකින් දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබාදීමට යම් කාලයක ප්‍රමාදයක් ඇති වන්නේ මෙම වැඩසටහන බාධාවකින් තොරව ඉදිරියට ගෙන යාම සඳහා සමෘද්ධි බැංකු සංගම්වල දැනට පවතින පොදු සුභසාධන අරමුදල් ලාභ වෙන් කිරීමේ සංචිතවල ඇති මුදල් ශේෂය නොඉක්මවන පරිදි මුදල් ගෙවා නිරවුල් කිරීමටත් එම මුදල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ප්‍රධාන කාර්යාලයට එවා ප්‍රතිපූර්ණය කර ගත හැකිය. ඒ සඳහා දැයට කිරුළ ආකෘති පත්‍ර 02 භාවිතා කරන්න.

එමෙන්ම මෙහිදී තෝරා ගන්නා ලද ප්‍රතිලාභීන් සඳහා උළු බෙදාදීමේ වැඩසටහනේ පළමු අදියර යටතේ ක්‍රියාත්මක උළු ලබාදීම හා උළු සෙවිලි කිරීමේ කටයුතු සම්පූර්ණයෙන්ම දිස්ත්‍රික් තුනෙහිම අවසන් කළයුතු අතර සනීපාරක්ෂක වැසිකිලි පහසුකම් සැපයීම, වහල සකස් කිරීම හා බිත්ති බැද වහල සකස් කිරීම් කටයුතු ඒ ඒ ප්‍රදේශයට ගැලපෙන ලෙස ක්‍රියාත්මක කළ යුතුය. එහිදී දැනට රජයෙන් හා සමෘද්ධි බැංකුවෙන් හෝ වෙනත් අයගෙන් ලබාදෙන ප්‍රදානයන් ප්‍රමාණවත් නොවන බව පෙනී යන්නේ නම් එම ප්‍රතිලාභීන්ට අදාළ සමෘද්ධි බැංකු සංගම් වෙතින් 10% පොලී ප්‍රතිශතයකට රු. 100,000/- ක උපරිමයකට යටත් ණය මුදලක් ලබාදීම සිදු කල හැකිය.

07. මෙම වැඩ පිළිවෙල වඩාත් ප්‍රායෝගිකව හා සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි අධිකාරිය ලබාදෙන ප්‍රතිපාදනවලට අමතරව සමෘද්ධි බැංකු සංගමය මගින් මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත අවශ්‍යතාවයට අනුව පොදු සුභසාධන අරමුදලින් හා රඳවා ගත් ලාභ අරමුදල්වලින් මුදල් නිදහස් කිරීම අනුමත කර ඇත. ඒ සඳහා තෝරා ගත් ප්‍රතිලාභීන්ගේ නිවාස උළු සෙවිලි කිරීමේ මට්ටමට ගෙන ඒමට හා සනීපාරක්ෂක පහසුකම් ලබාදීමට සියළු දෙනාගේ සහය ලබා ගෙන දිරිය පියස නිවාස වැඩසටහනේ ක්‍රම වේදය අනුගමනය කළ යුතුය.

08. උක්ත කාණ්ඩ 05 යටතේ මුදල් නිදහස් කිරීමෙන් අනතුරුව සෑම මසකම 05 හා 20 දින වන විට සති දෙකක ප්‍රගතිය අදාළ ආකෘති පත්‍රවලට අනුව පහත පරිදි වාර්තා කළයුතු වේ.

| | |
|---|---|
| දැ. කි. අංක 03,03(අ) | වසමේ නිලධාරියා හා කලාප සහකාර විසින් සම්පූර්ණ කර කලාප කළමණාකරු ගේ නිර්දේශය මත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යැවිය යුතු වේ. |
| දැ. කි. අංක 04 | මූලස්ථාන කළමණාකරු කළමණාකාර අධ්‍යක්ෂ සහතික කර ප්‍රාදේශීය ලේකම් / ප්‍රාදේශීය සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂගේ අනුමැතිය සහිතව දිස්ත්‍රික් කාර්යාලය වෙත යැවිය යුතුය. |
| දැ. කි. අංක 06 | දැයට කිරුළ ආකෘති පත්‍ර අංක 05 අනුසාරයෙන් සකස් කළ ප්‍රගතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමාජ සංවර්ධන විෂයය කළමණාකරු බැංකු විෂයය කළමණාකරු සකස් කර සමෘද්ධි සහකාර කොමසාරිස්/ සම්බන්ධීකරණ නිලධාරි සහතික කර දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය වෙත ලබාදිය යුතුය. |

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් හා අතිරේක ලේකම් (සංවර්ධන) චන්ද්‍රා වික්‍රමසිංහ මහත්මියගේ අත්සනින් යුතුව ලබාදී ඇති උපදෙස් අනුව මීට අමතරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අවශ්‍ය තොරතුරු අදාළ නිලධාරීන් මගින් ලබාදෙනු ඇත.

09. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය වෙනුවෙන් මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ක්ෂේත්‍ර නිලධාරීන්, කළාප සහකාර, සමාජ සංවර්ධන සහකාර, බැංකු කළමණාකරු, ව්‍යාපෘති කළමණාකරු, කළමණාකාර අධ්‍යක්ෂ, මූලස්ථාන කළමණාකරු, දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි හා සහකාර සමෘද්ධි කොමසාරිස් / දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ ඇතුළු සියළුදෙනා මෙහි වගකීම දැරිය යුතුය. ප්‍රාදේශීය ලේකම් /ප්‍රාදේශීය සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ අධීක්ෂණය හා මග පෙන්වීම යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක විය යුතුය

මහින්ද චින්තන ඉදිරි දැක්ම යථාර්ථයක් කරමින් දිළිඳුකමින් තොර සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් ගොඩ නැගීම සඳහා වෙහෙස වන ඔබ සැමගේ සේවය ස්තූති පූර්වකව අගය කරමු.

| | | |
|---|---|---|
| **ආර්.පී.බන්දුල තිලකසිරි,** | **සී.ඩී. කළුආරච්චි,** | **කේ.කේ.එල්. චන්ද්‍රතිලක,** |
| **අධ්‍යක්ෂ ජනරාල්.** | **සාමාන්‍යාධිකාරි/අධ්‍යක්ෂ** | **නියෝජ්‍ය අධ්‍යක්ෂ,** |
| | **(බැංකු මූල්‍ය කටයුතු)වැ.බ.** | **(බැංකු මූල්‍ය කටයුතු හා මහා සංගම්)** |

පිටපත් :-

01. ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා - කා.දැ.ගැ.ස.
02. ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා - කා.දැ.ගැ.ස.
03. ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු සුසන්ත පුංචිනිලමේ මැතිතුමා - කා.දැ.ගැ.ස.
04. ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු මුත්තු සිවලිංගම් මැතිතුමා - කා.දැ.ගැ.ස.
05. ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ල මැතිතුමා - කා.දැ.ගැ.ස.
06. සියළුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු - කා.දැ.ගැ.ස.
07. ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - අ.ක.ස.
08. අතිරේක ලේකම් (ග්‍රාමීය ආර්ථික), ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - අ.ක.ස.
09. අතිරේක ලේකම් (සංවර්ධන), ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - අ.ක.ස.
10. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් - අ.ක.ස.
11. නියෝජ්‍ය අභ්‍යන්තර විගණක. - අ.ක.ස.

දැ.කි.අ. 01

.........................................

.........................................

.........................................

2013.

ප්‍රාදේශීය ලේකම් / ප්‍රාදේශීය සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ මගින්,
දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
සහකාර සමෘද්ධි කොමසාරිස් / දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
.......................................

**දැයට කිරුළ 2014 - ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව**

**"ඉසුරුමත් නිවහනක්" වැඩසටහන යටතේ නිවාස සඳහා උළු ලබා ගැනීම.**

.................................. දිස්ත්‍රික්කයේ ........................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ............................. ග්‍රාම නිලධාරි වසමේ ඉහත ලිපිනයේ පදිංචි ............................................................................. වන මාගේ නිවස සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය හරහා ප්‍රදානයක් වශයෙන් ලබාදෙන පහත සඳහන් සාමාන්‍ය උළු හා මුදුන් උළු කැට .......................... කර්මාන්ත ශාලාවෙන්/ උළු සංගමයෙන් මා වෙත ගෙනවිත් භාරදුන් බවත් මාගේ දැනුමේ හැටියට එම උළු නියමිත ප්‍රමිතියට අනුව තිබූ බවත් මේ මගින් සහතික කරන අතර, ඒ සඳහා අවශ්‍ය මුදල් අදාළ උළු නිපදවන්නන්ගේ සංගමයට/ කර්මාන්ත ශාලාව වෙත ගෙවීමට එකග වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

| උළු භාරදුන් දිනය | රිසිට් පත් අංකය | භාර දුන් උළු ප්‍රමාණය | | භාර ගත් උළු ප්‍රමාණය | | ආපසු යැවූ ප්‍රමාණය | | උළු කැටයක මිල | | උළු සඳහා ගෙවිය යුතු මුදල රු. | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සාමාන්‍ය | මුදුන් | සාමාන්‍ය | මුදුන් | සාමාන්‍ය | මුදුන් | සාමාන්‍ය | මුදුන් | සාමාන්‍ය | මුදුන් |
| | | | | | | | | | | | |

ප්‍රතිලාභී අත්සන :- .................................

ජාතික හැඳුනුම්පත් අංකය :- .................................

........................................................... මහතා / මහත්මිය / මෙනවිය වෙත .......................................... උළු කර්මාන්ත ශාලාවෙන්/උළු සංගමයෙන් ගෙනවිත් භාරදී තිබූ උළු හා මුදුන් උළු මා පරීක්ෂා කළ අතර මාගේ දැනුමේ හා විශ්වාසය පරිදි නියමිත ප්‍රමිතියක් තිබූ බවත් / නොතිබූ බවත් මේ මගින් සහතික කරන අතර උළු සඳහා අවශ්‍ය ගෙවීම් කිරීම සුදුසු බව / නුසුදුසු බව මෙමගින් සහතික කර සිටිමි.

අත්සන :- ..................................... අත්සන :- .....................................

නම :- ..................................... නම :- .....................................

වසම භාර සමෘද්ධි නිලධාරි :- ...................................... බැංකු සංගම් කළමණාකරු :- ......................................

**දැ.කි.අ. 02**

……………………………….…

…සමෘද්ධි බැංකු සංගමය,

2013.

ප්‍රාදේශීය ලේකම් / ප්‍රාදේශීය සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ මගින්,

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

......................................

**<u>2014දැයට කිරුළ - ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව</u>**

**<u>"ඉසුරුමත් නිවහනක්" වැඩසටහන යටතේ නිවාස සඳහා උළු ලබා ගැනීම.</u>**

.................................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ .............................. සමෘද්ධි බැංකු සංගමය මගින් තෝරා ගන්නා ලද පහත නම් සඳහන් දිරිය පියස නිවාසලාභීන් වෙත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය ක්‍රියාත්මක කරන උළු ලබාදීමේ වැඩසටහන යටතේ ලබාදී ඇති සාමාන්‍ය උළු ........... හා මුදුන් උළු ........... සඳහා ...........................................උළු නිපදවන්නන්ගේ සංගමය/ උළු කර්මාන්ත ශාලාව වෙත ගෙවීම සඳහා නිකුත් කරන ලද ............................ දිනැති අංක .............................. දරණ ලංකා බැංකුවේ / මහජන බැංකුවේ රුපියල් ................................ වටිනා චෙක්පත මේ සමග ඉදිරිපත් කරමි.

02. ගෙවීම් කිරීම සඳහා පහත සඳහන් ලේඛණ අමුණා ඇත.

I. උළු ලබා ගත් ප්‍රතිලාභීන්ගේ සහතිකය
II. උළු ලබා ගත් ප්‍රතිලාභි නාම ලේඛණය හා ගෙවීම් වාර්තාව.
III. උළු කර්මාන්ත ශාලාව ලබාදුන් ඉන්වොයිස් පතහි මුල් පිටපත.
IV. ගෙවීම් කිරීම සඳහා වූ චෙක්පත.

.......................................................

කළමණාකරු,

සමෘද්ධි බැංකු සංගමය.